**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - 2016**

---

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 34 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2017 ජුනි 19 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද 2011 වර්ෂයේදී පරිගණක සහ කාර්යාලීය උපකරණ පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට ක්ෂය කර අවසන් කර තිබුණද තවදුරටත් භාවිතා කරන දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.32,721,378 ක් විය. 2015/2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවලින් ඉවත් කිරීම සඳහා හඳුනාගෙන ඇති වත්කම් ඉවත් කර අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 අංක 20 දරන විදුලිබල පනතේ 46 වන වගන්තිය හා බලපත්‍රලාභීන් වෙත නිකුත් කරනු ලබන විදුලි උත්පාදන බලපත්‍රයෙහි කොන්දේසි අංක 11 පරිදි කොමිෂන් සභාවට ගෙවිය යුතු වාර්ෂික නියාමන බදු ලෙස 2014 හා 2015 වර්ෂවලට අදාළව විදුලිබල මණ්ඩලයෙන් රු.81,852,700 ක් හා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අනෙකුත් ආයතනවලින් රු.215,240 ක් 2017 ජුනි මාසය වනවිටත් අයකරගෙන නොතිබුණි.

(ආ) ලිහිසි තෙල් අලෙවි සමාගම්වලින් අය කරනු ලබන අර්ධ වාර්ෂික විචල්‍ය ලියාපදිංචි ගාස්තු අදාල කාලපරිච්ඡේදය අවසන් වී දින 30 ක් ඇතුළත කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 06 ට අදාළව අලෙවි සමාගම් දෙකකින් ලැබිය යුතු ඇස්තමේන්තු ගාස්තු රු. 1,562,263 ක් 2017 ජූනි මාසය වන විටත් අයකර ගෙන නොතිබු අතර එම එක් සමාගමකින් වර්ෂ කීපයකට පෙර සිට තවදුරටත් ලැබිය යුතු රු. 1,134,698 ක ශේෂයක් පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 (2) (ඇ) හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය නිමවූ විගසම පියවිය යුතු වුවත් 2012 වර්ෂයේ දකුණු ආසියා යටිතල පහසුකම් නියාමන සංසදයේ වැඩසටහනට ගෙවන ලද රු.55,000 ක අත්තිකාරම් මුදල 2016 දෙසැම්බර් 31 වන විටත් පියවා නොතිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) හා 4.2.2 මාර්ගෝපදේශ | 2016 වර්ෂය සඳහා වූ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන සකස් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,082,655 ක ඌනතාවක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,048,768 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,131,423 ක පිරිහීමක් නිරීක්ෂණය විය. විචල්‍ය ලියාපදිංචි ගාස්තු ආදායම රු.6,158,948 කින් වැඩිවී තිබුණද පුද්ගල පඩිනඩි වියදම රු.8,101,684 කින් හා මෙහෙයුම් වියදම රු. 6,722,483 කින් වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අතිරික්තයක් විය. 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී අතිරික්තය සියයට 84 කින් අඩුවී තිබූ අතර 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 176 කින් අඩුවී ඌනතාවයක් බවට පත්වී තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.92,491,830 ක්වූ දායකත්වය විවිධ උච්චාවචනයන් සහිතව සමාලෝචිත වර්ෂයේදී රු.98,274,006 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ (14) වගන්තියේ සඳහන් වන පරිදි කොමිෂන් සභාවේ අරමුණු පහත පරිදි වේ.

- සියලු පාරිභෝගිකයන්ගේ අයිතිය ආරක්ෂා කිරීම හා තරඟකාරීත්වය ප්‍රවර්ධනය.

- විදුලිබල, ජලසේවා සහ ඛනිජ තෙල් යන මහජන උපයෝගිතා කර්මාන්තවල ක්‍රියාකාරීත්වය සහ ප්‍රාග්ධන ආයෝජන දෙකහිම කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය, ඒවායේ ආරක්ෂාකාරීත්වය සහ සේවාවල ගුණාත්මකභාවය ප්‍රවර්ධනය හා ඒවාට සම්පත් කාර්යක්ෂමව වෙන්කර දීම ප්‍රවර්ධනය.

- හැකි අවස්ථාවලදී ජාත්‍යන්තර ප්‍රමිතිවලට ප්‍රතිපාර්ශ්වික උපයෝගිතා සේවා ''බෙන්ච්මාර්ක් '' කිරීම සහ කාර්යක්ෂමව ක්‍රියා කරන මිල පාලිත අස්ථිත්වවලට ඔවුන්ගේ මහජන උපයෝගිතා කර්මාන්ත සඳහා මුදල් සපයා ගැනීමෙහිලා අයථා දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු නොවන බවට වග බලාගැනීම.

ඉහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉහත පනත ප්‍රකාරව උපයෝගීතා කර්මාන්ත ලෙස දක්වා තිබූ විදුලිය, ජලය හා ඛනිජ තෙල් යන කර්මාන්තවලට අදාළ නියාමන කටයුතු සභාව විසින් සිදු කළ යුතු වුවත් ඛනිජ තෙල් හා ජලය ආශ්‍රිත කර්මාන්තවලට කොමිෂන් සභාවේ සේවය ලබාගැනීමට අවශ්‍ය නෛතික ප්‍රතිපාදන අදාළ ආයතන මඟින් මෙතෙක් එකී කර්මාන්ත පිහිටුවීමේ පනත්වලට ඇතුළත් කර නොතිබුණි. එබැවින් කොමිෂන් සභාවේ සේවය විදුලිබල කර්මාන්තයට පමණක් සීමා වී තිබූ අතර ජලය හා ඛනිජ තෙල් කර්මාන්තවලට අදාළව සේවය සැපයීමේ අරමුණ ඉටු කර ගැනීමට එය බාධාවක් වී තිබුණි.

(ආ) සමාලෝචිත ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබූ රු.2,300,000 ක් වටිනා කාර්යයන් දෙකක් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය නොලැබීම හේතුවෙන් එම කාර්යයන් ක්‍රියාත්මක කළ නොහැකිව තිබුණි.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2(ඩී) හා (ඊ) ඡේද අනුව නව කාර්ය මණ්ඩලයෙහි සංවිධාන ව්‍යුහය සංශෝධනය කර එය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කර අනුමැතිය ලබාගත යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) උක්ත (අ) හි සඳහන් චක්‍රලේඛයෙහි 9.3 ඡේදය අනුව බඳවා ගැනීම් හා උසස් කිරීම්වලට අදාල ක්‍රමවේදය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව අදාල අමාත්‍යාංශය වෙත යොමුකර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

## 5.1 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් තත්‍ය වියදම් සමඟ සැසඳීමේදී අයිතම් 05 ක සියයට 21 සිට සියයට 42 අතර අධි ප්‍රතිපාදනයක් පැවතීමෙන් කළමනාකරණ පාලන උපක්‍රමයක් ලෙස අයවැය ලේඛනය යොදා ගැනීමේ දුර්වලතාවයක් පැවති බව නිරීක්ෂණය විය.

# 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) කාර්ය මණ්ඩල පරිපාලනය | කාර්ය මණ්ඩලයෙහි සංවිධාන ව්‍යුහය සඳහා අනුමැතිය ලබා නොගැනීම. |
| (ආ) ආදායම් පරිපාලනය | හිඟ බලපත්‍ර ගාස්තු හා නියාමන ගාස්තු අයකර ගැනීම කාර්යක්ෂම නොවීම. |